# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1276 / 2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2023

දිනය / திகதி / Date: 09/10/2023 පැය 1210

## මාධ්‍ය නිවේදනය

**01. 2023.10.08 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 33 | 1560 | තඹ දඟර 01යකඩ බැරල් 09 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් සහ අදාල දේපල පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇති අතර, ඔවුන්ට විරුද්ධව එම පොලිස් ස්ථාන මගින් නඩු පැවරීමට කටයුතු කරනු ලබයි.

**02. මත් කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුර කඳවුර.**

2023.10.08 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අනුරාධපුරය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත නොච්චියාගම පොලිස් වසමේ නිකවැව, නොච්චියාගම ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මත්පෙති 48 ක් සන්තකයේ තබාගෙන ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන නොච්චියාගම පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 18 ක්වූ එරුක්කල්පිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** නොච්චියාගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03.** **කොකෙන් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුර.**

2023.10.08 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මන්නාරම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පේසාලේ පොලිස් වසමේ මුරුගන්කෝවිල් ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර කොකේන් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 20 ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පේසාලේ පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක්වූ පේසාලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පේසාලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**04.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුර.**

2023.10.08 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත තණමල්විල පොලිස් වසමේ තණමල්විල ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන තණමල්විල පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38 ක්වූ තණමල්විල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** තණමල්විල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**05.** **බලපත්‍ර නොමැතිව දැව ප්‍රවාහනය කරමින් සිටි ලොරි රථයක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුර.**

2023.10.08 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා යාපනය කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත යාපනය පොලිස් වසමේ පාලඩි හන්දිය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර බලපත්‍ර නොමැතිව කපා පලන ලද දැව ලොරි රථයකින් ප්‍රවාහනය කළ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන යාපනය පොලිස් ස්ථානයට භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක්වූ වව්නියාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** යාපනය පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**06.** **හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුර.**

2023.10.08 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත බෙලිඅත්ත පොලිස් වසමේ සිටිනමළුව ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 07 මිලි ග්‍රෑම් 210 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන බෙලිඅත්ත පොලිස් ස්ථානයට භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 29 ක් වූ තංගල්ල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. බෙලිඅත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**